


# පිරිසිදු කිරි නිෂ්පාදනයෙහි ඇති වැදගත්කම ඔබ දන්නවාද ?

මැදරට සත්ව පාලන නිලධාරි බර්නාඩ් පීරිස් විසිනි.

ඔබේ ප්‍රදේශයෙහි කිරි එකතුකරන සමූපකාර සමිතියට නැතහොත් ජාතික කිරි මණ්ඩලයට ඔබ විසින් සපයනු ලබන කිරි, අලෙවිය සඳහා නුසුදුසු යැයි ප්‍රතික්ෂේප කරන බව ඔබ අසා ඇත. එසේනම් ඊට පහත සඳහන් දෑ හේතුවිය හැකියැයි ඔබ දන්නවාද ?

ඔබේ ගව ගාල හා ඒ අවට පරිසරය අපිරිසිදුව තිබීම.

ඔබේ ගව පට්ටියේ දෙනුන් නැතහොත් ගවයින් පිරිසිදුව, නිරෝගිව නොසිටීම,

කිරි දොවින දෙනුන්ගේ බුරුල්ල මැනවින් සේදීම නොකිරීම.

කිරි දෙවීමට ප්‍රථම දොවින ඔබගේ හෝ කිරි දොවන්නාගේ අත් මැනවින් සෝදා පිරිසිදු කර නොගැනීම.

කිරි දෙවීමට හා කිරි දැමීමට ගන්නා භාජන මැනවින් සෝදා පිරිසිදුකර නොගැනීම.

දෙනගේ බුරුල්ල, කිරි දොවන්නාගේ අත් හා භාජන සේදීමට අපවිත්‍ර ජලය ගැනීම.

දොවාගත් කිරි ආවරණයක් රහිත භාජනවල දමා අපවිත්‍ර ස්ථානවල තැබීම.

දොවාගත් කිරි කල්වේලා ඇතිව භාර නොදීම.

උදේ වරුවේ දොවාගත් කිරි, සවස්වරුවේ දොවාගත් කිරි වලට එකතු කිරීම හෝ සවස දොවාගත් කිරි පසු දා උදේ කිරි වලට එකතු කිරීම.

කිරි වලට නීත්‍යානුකූල නොවන වෙනත් ද්‍රව්‍ය එකතු කිරීම.

දොවාගත් කිරි ලෝහ භාජනවල දමා උෂ්ණත්වයට හෝ හිරුඑළියට ගොදුරු වන ස්ථානවල තැබීම.

ගවගාලේදී ගවයින්ගේ ගොම මුත්‍රාදිය හා දූවිලි රොඩු යනාදිය, කිරි වලට හෝ භාජනවලට එකතු වීම.

රෝගී දෙනුන්ගේ කිරි ලබාගැනීම (විශේෂයෙන්ම මැස්ටයිටිස් නැතහොත් බුරුල්ලේ ප්‍රදාහය ඇති දෙනුන්).

ඉහත සඳහන් හේතුන්ගෙන් එකක් හෝ කිහිපයක් හෝ ඔබේ කිරිවල තත්ත්වය දුර්වල කරන්නේ විය හැකිය. මේ නිසා ඔබට සිදුවන්නේ විශාල පාඩුවකි. ඔබ ප්‍රදේශයේ කිරි එකතු කරන සමූපකාර සංවිධානයටද වන්නේ විශාල පාඩුවකි. නිෂ්පාදනය සඳහා ඔබේ වටිනා ශ්‍රමයත් මුදලත් වැයකොට නිපදවනු ලබන කිරි තත්ත්වයෙන් දුර්වලවීම නිසා අලෙවිකර ගැනීමට නොහැකිවන්නේ පමණක් නොව මිනිසාගේ ප්‍රයෝජනයට ගැනීමට ද සුදුසු නොවේ. එපමණක්ද නොව අපිරිසිදු කිරි නිපදවා මහජනතාව අතරට යැවීමෙන් ඔබේ සහෝදර ජනතාව රෝගීන් කිරීමට ඔබ කොටස් කාරයෙක්ද වේ. කරුණු එසේ නම් ඔබේ අනගිතම ව්‍යාපාරය ලාභ සහිතව පවත්වා ගැනීමට පිරිසිදු කිරි නිපදවීමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කුමක්දැයි විමසා බලමු.

ඔබේ ගව ගාල ගොම මුත්‍රාදියෙන් තොරව පිරිසිදුකර තබාගන්න. ගව ගාල අවට පරිසරය ගොම මුත්‍රා ගොඩ ගැසූ වලවල් හා කුණු කසල ගොඩවල්වලින් තොරව තබාගන්න.

නිරෝගී ගවයින් පමණක් ඔබේ ගවගාලේ තබාගන්න.

කිරි දෙවීමට පෙර ගවගාල පිරිසිදු කරන්න. ඊළඟට කිරි දොවන දෙනගේ කකුල් බඳින්නේ නම් කකුල් දෙකද, වලිගයද අසුවන සේ ගැට ගසන්න. ඊළඟට ඔබේ අත්දෙක සෝදා ගත් පසු දෙනගේ බුරුල්ල සෝදන්න. තන පුඩු පමණක් සේදීම නොකරන්න. සම්පූර්ණ බුරුල්ලම සෝදන්න. අත් හා බුරුල්ල සේදීමට සන්ලයිට් සබන් ගන්න. සබන් ගා නැවතත් හොඳින් සෝදන්න. සේදීම සඳහා පිරිසිදු වතුර පමණක් ගන්න. ඉන්පසු තන බුරුල්ල අතින් හොඳින් පිරිමදින්න. මේ නිසා බුරුල්ලේ තෙතමනය ඉවත්වනවා මෙන්ම කිරි එරවීමට දෙනට ප්‍රබෝධයක්ද ලැබේ. (දෙනගේ බුරුල්ල ප්‍රදේශයේ ලෝම ඝනව වැඩී ඇත්නම් ඒවා කපා ලෝම වලින් තොරව තබා ගත යුතුය).

කිරි එරවූ පසු දෙවීම ආරම්භ කරන්න. පළමුවෙන්ම සෑම තන පුඩුවකින්ම කිරි පහර බැගින් කළු පැහැති මතු පිටක් ඇති භාජනයකට දොවාගෙන කිරි කැටි ගැසී ඇත්දැයි බලන්න. එසේ ඇත්නම් එවැනි දෙනුන්ගේ කිරි වෙනම දොවා ගන්න. වෙනම භාජනයකට දමන්න. (එවැනි දෙනුන් පිළිබඳ ඔබේ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය වරයාට දන්වා වහාම ප්‍රතිකාර ලබාගන්න).

කිසිම හේතුවක් නිසාවත් කිරි ගැනීමට පෙර හෝ කිරි දෙවීමේදී දෙනුන් කුලප්පු නොකරන්න. හැකි ඉක්මණින් කිරි දොවා නිම කරන්න.

කිරි දෙවීමට හා ඇමීමට ගන්නා භාජන ඉතා හොඳින් සෝදා පිරිසිදු කොට උණු වතුරෙන් තම්බා විෂ බීජ නසාගත් ඒවා විය යුතුය.

කිරි දෙවීමට හා ඇමීමට ඇලුමිනියම් හෝ එනමල් භාජන පාවිච්චි කරන්න. කිරි දොවාගත් විගස ඒවා පෙරා, පියනක් සහිත භාජනයකට දමා වසන්න. ආවරණයක් රහිතව ගවගාල් තුළ නොතබන්න.

කිරි ඇමූ භාජන උෂ්ණවයක් ඇති ස්ථානයක හෝ හිරුඑළිය ඇති ස්ථානවල නොතබන්න.

කිරි දොවාගත් පසු හැකි ඉක්මණින් අලෙවිය සඳහා ගෙන යන්න.

කිරි වලට කිසිම ද්‍රව්‍යයක් එකතු නොකරන්න. එය නීති විරෝධී ක්‍රියාවක් බව ද සලකන්න.

කිරි දොවන වරු අතර සම කාල පරතරයක් තබන්න. කිරි අලෙවි කරන වේලාව අනුව මෙය ඉටු කිරීමට වග බලාගන්න.

කිරි දොවන්නා ද නිරෝගිමත්, පිරිසිදු අයෙකු වීම තවත් ඉතා වැදගත් අවශ්‍යතාවයකි.

කිරි දෙනුවන්හට නිසි කලට වේලාවට මනාවින් පිරිසිදු ජලය හා ආහාර සපයන්න.

රෝගී දෙනුන්ගේ කිරි, නිරෝගී දෙනුන්ගේ කිරි දොවා ගත් පසු දොවා ගන්න. එවැනි කිරි නිරෝගී දෙනුන්ගෙන් ලබාගත් කිරි වලට එකතු නොකරන්න.

දෙනුන්ගේ තන බුරුල්ලේ සීරීම් තුවාල යනාදියට හොඳින් ප්‍රතිකාර කරන්න.

ඉහතින් සඳහන් ක්‍රියා මාර්ගය අවංකව, සැලකිලිමත්ව ඉටු කිරීමෙන් කිරි නරක්වීම වළක්වා ගත හැක. මේ නයින් ඔබ විශාල යුතුකමක් හා වගකීමක්ද ඉටු කරන්නේය.

අපි පිරිසිදු කිරි නිපදවමු. ඒවා අලෙවිය කොට ලාභ ලබමු. අපේ සහෝදර ජනතාවගේ සෞඛ්‍යය සඳහාත් ඔබේ ව්‍යාපාරයෙන් ලාභය සඳහාත් අපි පිරිසිදු කිරි නිපදවිය යුතු වෙමු.

## මගේ රට

1. හෙළ විරුවනගෙ රන් දහඩිය වලින් — තෙමී
සිඳ බිඳ දමා එඩිතරවම වහල් — බැමී
"පෙරදිග මුතු ඇටය" විරුදාවලිය — හිමී
මගෙ සිරිලක් මවුනි, ඔබෙ පා වඳිමි — නැමී

2. යුද බිය ගිනි බියද මෙහි කිසි දිනක — නැත
ගොඩ මඩ සරුව ගහකොළ පලබරව — ඇත
මගෙ හෙළ දරුවන් මව්බිම අපිරි — මිත
රැකගමු සදා එය අප යුතුකමව — ඇත

පේරාදෙණියේ, දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයේ
මාලා වික්‍රමරත්න ගෙනි.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018/01/09
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.S. Karunarathna

Signature : Sithara

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature :

Date : 2018/01/09

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*